**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2015**

**-----------------------------------------------------**

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 55 දරන ජාතික මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ **14(2)**(සී) වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

--------------------

**2.1** තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

**2.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02

-----------------------------------------------

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළින් මූල්‍යමය වෙනස්වීම් පමණක් නිරූපණය විය යුතු නමුත් මූල්‍යමය චලනයක් සිදු නොවූ රු. **26,775,848** ක ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ඇතුළත් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03

-----------------------------------------------

**(i)** අස්තිත්වයන් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවලදී සිදු වී ඇති වැරදි සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහිම අතීතානුයෝගීව නිවැරදි කිරීම් කළ යුතු වුවත්, 2014 වර්ෂයට අදාළව විගණකාධිපති වාර්තාව මඟින් පෙන්වා දී තිබූ එකතුව රු.**337,026,080** ක්වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම් සහ එකතුව රු.129,750 ක්වූ ගිණුම්කරණ අඩුපාඩු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර දක්වා නොතිබුණි.

**(ii)** ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 65,948,057 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

-----------------------------------------------

දේපළ, පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණන අගයට ප්‍රකාශ කර ඇති විට එම වත්කම් සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතු ප්‍රත්‍යාගණනය බලපවත්වන දිනය, ස්වාධීන තක්සේරුකරුවකු සහභාගීවූයේද යන්න සහ වත්කම්වල සාධාරණ අගය ඇස්තමේන්තු කිරීමේදී යොදාගත් ක්‍රමවේදයන් හා ප්‍රමාණාත්මක උපකල්පනයන් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් ආයතනයට පවරා දී තිබුණු රු.12,780,000 ක් වටිනා මෝටර් රථ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ආයතනය නමින් ලබාගෙන තිබූ පේටන්ට් බලපත්‍ර 04 හි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවිය යුතු නිවාස කුලී රු.160,570 ක් ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ අවසානයට ස්ථාවර තැන්පත් සහතිකපත්‍ර 02 ක වටිනාකම රු.5,774,320 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත්, බැංකු සනාථ කිරීම් අනුව එය රු.5,448,500 ක් විය. මෙම වෙනසට හේතුන් අනාවරණය කරගෙන නොතිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. **112,222,982** ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ආයතනීය අර්ථසාධක අරමුදල් ශේෂය | 70,836,667 | විගණනය කළ අවසන් ගිණුම් |
| (ආ) | විශ්‍රාමික නිලධාරීන්ගේ අරමුදල් ශේෂය | 1,704,529 | - එම - |
| (ඇ) | පුස්තකාල පොත් | 14,766,435 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| (ඈ) | රසායනාගාර උපකරණ මෙවලම් හා ලී බඩු | 24,915,351 | - එම - |
| | | **112,222,982** | |

2.3 ලැබිය යුතු ගිණුම්

2012 වර්ෂයේදී ඉදිකිරීම් 05 ක් වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවන ලද අත්තිකාරම් මුදලින් ආයතනයට ආපසු අය විය යුතු රු.614,980 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | **II** පරිච්ඡේදයේ 13.1.2 වගන්තිය | ආයතනයේ අනුමත බඳවා ගැනීම් පරිපාටියට අනුව පරිපාලන නිලධාරී තනතුර සඳහා උපාධියක් සහිත නිලධාරියෙක් පත්කළ යුතු වුවත්, ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පුරප්පාඩු වී ඇති පරිපාලන නිලධාරී තනතුරට එකී සුදුසුකම් සපුරා නොමැති මාණ්ඩලික සහකාර (ලිපිකරු) නිලධාරිනියක් 2014 පෙබරවාරි 24 දින සිට වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි. |

(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | | |
|---|---|---|
| **(i)** | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු. **363,580,492** ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |
| **(ii)** | 2002 නොවැම්බර් 28 දිනැති අංක **IAI/2002/02** දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.25,022,297 ක් වූ පරිගණක හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 07 වගන්තිය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිලධාරීන් 15 දෙනෙකු පුහුණු නිලධාරීන් ලෙස බඳවාගෙන ඔවුන්ට ස්ථිර කාර්ය පැවරුම් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ආයතන අරමුදලින් එකතුව රු. **824,413** ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය | අධ්‍යයන දීමනා සේවක අර්ථසාධක අරමුදලට, විශ්‍රාම වැටුප් අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වයට අදාළ කර නොගත යුතු වුවත්, ඊට පටහැනිව ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවන ලද අධ්‍යයන දීමනාව පදනම් කරගැනීම නිසා ඉහත අරමුදල්වලට ආයතනයේ දායකත්වය ලෙස රු. 2,364,769 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

**2.5** ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ සහකාර පුස්තකාලාධිපති සහ නියෝජ්‍ය ගණකාධිකාරී ලෙස තනතුරු දෙකක් ඇති කර ආයතනයේ නිලධාරීන් දෙදෙනෙකු එම තනතුරු සඳහා උසස් කර වැටුප් සහ සේවක අර්ථසාධක අරමුදල් ලෙස එකතුව රු.8,448,372 ක් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.49,680,749 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.30,590,273 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,090,476 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන රු.9,559,000 කින් වැඩිවී තිබුණද පෞද්ගලික වැටුප් සහ වේතන වියදම රු.25,952,896 කින් වැඩිවීම හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් රු.3,344,503 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම ඌනතාවයක් ඇති වී තිබුණු අතර, සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකීමේදී 2011 වර්ෂයේදී රු. 64,610,581 ක් සෘණ අගයක් වූ ආයතනයේ දායකත්වය 2015 වර්ෂයේදී රු. 104,397,177 ක ධන අගයක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය සියයට 34 සිට සියයට 30 දක්වා අඩුවීම හේතුවෙන් ආයතනයේ ජංගම වත්කම් භාවිතයෙන් ජංගම වගකීම් පියවීමේ හැකියාව සියයට 4 කින් අඩු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

4.1 කාර්යසාධනය

------------------

1997 අංක 05 දරන පනතෙන් සංශෝධිත 1981 අංක 55 දරන ජාතික මූලික අධ්‍යයන ආයතන පනතේ 2(4) වගන්තිය ප්‍රකාරව, ජාතික අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිලිමත් වීම සහ එහි ආරක්ෂාකාරී බව වැඩිදියුණුවීම සැලසෙන පරිදි කටයුතු කිරීම ආයතනයේ මූලික අරමුණ වුවද, ආයතනය විසින් කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති ජාතික අවශ්‍යතාවයන් ඉටුවන පරිදි සකස් වී නොතිබූ බව නිරීක්ෂණය විය. ආයතනය ආරම්භයේ සිට ගත වූ අවුරුදු 34 ක කාලය තුළ සිදු කරන ලද පර්යේෂණවලට අදාළව ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයෙන් සහ කොරියාව හා ඍතුගාලය යන රටවලින් පේටන්ට් බලපත්‍ර 11 ක් පමණක් ලබාගෙන තිබූ අතර, ඒවායේ මුල් පිටපත්ද ආයතනය සතුව නොතිබුණි. ඉන් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද බලපත්‍ර 08 න් 04 ක් පර්යේෂකවරුන් නමින් ලබාගෙන තිබුණු අතර, ලබාගත් පේටන්ට් බලපත්‍ර 03 ක් ආයතනය තුළ නොමැති බව නිරීක්ෂණය විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 1986 වර්ෂයේ සිට සේවයේ නියුතු නිලධාරීන්ගේ පදිංචිය සඳහා ලබාගෙන තිබූ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් දිගන නිලගම නිල නිවාස 06 ට අදාලව අත්සන් කරන ලද ගිවිසුම අස්ථානගත වී ඇති බව ආයතනයේ අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කර තිබුණද, නව ගිවිසුමක් අත්සන් කිරීමට විගණිත දිනය වූ 2016 මාර්තු 17 දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 19 ක පමණ කාලයක සිට අස්ථාන ගත වී ඇති, වටිනාකම සනාථ කිරීමට තොරතුරු ඉදිරිපත් නොකරන ලද පුස්තකාල පොත් 105 ක් සම්බන්ධයෙන් විගණන දිනය වූ 2016 මාර්තු 08 වන දින වන විටත් ආයතනීය කළමනාකාරීත්වය විසින් විධිමත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) ශුද්ධ වටිනාකම රු. 6,787,876 ක් වූ මෝටර් රථ 10 ක් සමාලෝචිත වර්ෂය තුළ රු.15,955,000 ක වටිනාකමකට ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවූ රු. 9,167,124 ක ප්‍රත්‍යාගණන ලාභයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, මෙම ප්‍රත්‍යාගණන කාර්යය සුදුසුකම් ලත් තක්සේරුකරුවකු විසින් සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ට අනුකූලව 2014 වර්ෂයට අදාළව සිදු වී ඇති වැරදි අතීතානුයෝගීව නිවැරදි කිරීමෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ දක්වා ඇති 2014 වර්ෂයේ අගයන්හි ඌනතාවය රු. 9,456,482 කින් වැඩිවීමක්ද, මුළු වත්කම් රු.7,389,359 කින් අඩුවීමක්ද, මුළු වගකීම් රු. 149,249 කින් වැඩිවීමක්ද, ස්කන්ධය රු.7,538,608 කින් අඩුවීමක්ද, දක්වා ඇතත්, එම නිවැරදි කිරීම් සඳහා පාලක මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පුස්තකාල පොත්, රසායන ද්‍රව්‍ය සහ වෙනත් උපකරණ මිලදී ගැනීම සඳහා වර්ෂ 09 සිට වර්ෂ 20 දක්වා කාලයක් තුළ විදේශ ආයතනවලින් ලබා දී තිබූ එකතුව රු. 280,734 ක අත්තිකාරම් 12 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව, අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික මූලික අධ්‍යයන ආයතනය පිහිටුවීමේ පනතේ කාර්යයන්ට පටහැනි ලෙස 2011 අගෝස්තු 31 දින විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ජාතික මූලික අධ්‍යයන ආයතනය වෙත සෝයා බෝංචි සඳහා යොදන "රයිසෝබියම් ආමකුලක නම් වූ දියර පොහොර විශේෂයට අදාළ ව්‍යාපෘතිය" පවරාගෙන එම නිෂ්පාදන බාහිර ආයතන 05 ක් මඟින් වෙළඳපලට හඳුන්වා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එමගින් රු.1,602,300 ක ආදායමක් උපයා තිබුණද ඒ වෙනුවෙන් රු.2,376,967 ක වියදමක් දැරීමට සිදුවීමෙන් රු.774,667 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) ප්‍රවාහන පහසුකම ලැබීමට හිමිකම් නොමැති කාර්ය මණ්ඩලයේ නිලධාරීන් පස්දෙනෙකු දෛනිකව දිගන නිල නිවාසවලට යැම සහ ඒම වෙනුවෙන් ආයතනයේ වෑන් රථයක් භාවිතා කර සමාලෝචිත වර්ෂයේ දී ඉන්ධන වෙනුවෙන් රු.257,200 ක් වැය කර තිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 05 කට පෙර අලෙවි කිරීම සඳහා ආයතනය විසින් මුද්‍රණය කරන ලද රු.151,170 ක වටිනාකමින් යුතු විද්‍යාත්මක කරුණු ඇතුළත් ප්‍රකාශන තොගයක් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) ආයතනයට විවිධ වැඩමුළු සහ ව්‍යාපෘති සඳහා රජයෙන් සහ වෙනත් පුද්ගලික ආයතනවලින් වර්ෂ ගණනාවකට පෙර ලැබී තිබුණු එකතුව රු.691,257 ක් වූ විශේෂ ප්‍රදාන **10** ක මුදල් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ප්‍රත්‍යාගණන වටිනාකම රු. 431,465 ක් වූ පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර දීර්ඝ කාලයක සිට පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ කාර්ය මණ්ඩලයයේ තනතුරු 05 ක පුරප්පාඩු 20 ක් පැවති අතර, ඉන් පර්යේෂණ කාර්ය මණ්ඩලයේ 11 දෙනෙකුගේ සහ පර්යේෂණ සහායකවරුන් 04 දෙනෙකුගේ පුරප්පාඩු පැවතීමෙන් ආයතනයේ පර්යේෂණ කටයුතුවල අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අවහිරතාවයක් ඇතිවන බව නිරීක්ෂණය විය.

4.7 වෙළඳපොල කොටස

------------------------

ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව ජාතික මූලික අධ්‍යයන ආයතනය 2014 / 2015 වර්ෂයේ 13953 වෙනි ස්ථානයේ පැවති නමුත්, 2015 / 2016 වර්ෂයේදී 14894 දක්වා ස්ථාන 941 කින් පහළ බැස තිබුණි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ස්ථාන අතරින් 2014 / 2015 වර්ෂයේදී 19 වන ස්ථානය ලබා තිබු නමුත් 2015 / 2016 වර්ෂයේදී එය 21 ස්ථානය දක්වා ස්ථාන 02 කින් පහළ බැස තිබුණි. තම

ශ්‍රේණිගත ස්ථානය රැකගෙන තවත් ඉදිරියට යාමට ආයතනය අපොහොසත් වී ඇති බව මෙයින් නිරීක්ෂණය වේ.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
-----------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය
-------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, සෑම ආයතනයකම අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක වී නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය
-------------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7 හා ප්‍රසම්පාදන අත්පොතේ 2.7.5 හි වගන්ති ප්‍රකාරව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු පත්කළ යුතු වුවත්, ඊට පටහැනිව ආයතනයේ අධ්‍යක්ෂ විසින් ප්‍රසම්පාදන කමිටුවට පත්කොට එම කමිටුවේ අනුමැතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.**34,796,153** ක්වූ ස්ථාවර වත්කම් සහ එකතුව රු.7,113,430 ක්වූ රසායන ද්‍රව්‍ය හා වීදුරු උපකරණ මිලදී ගෙන තිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය
--------------------------------

රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජූනි 02 දිනැති අංක **PED/12** දරන චක්‍රලේඛයේ 5.2 ප්‍රකාරව, වාර්ෂික අයවැය ලේඛනය සංයුක්ත සැලැස්මට අනුව දීර්ඝ කාලීන පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කළයුතු වුවද, පහත දැක්වෙන වෙනස්කම් නිසා අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ඇස්තමේන්තුගත වියදම් තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී වැය විෂයයන් සඳහා සියයට 10 සිට සියයට 97 ක් දක්වා පරාසයක විචලතාවයන් නිරීක්ෂණය විය.

(ආ) ගොඩනැගිලි තැනීම සහ පුනරුත්ථාපනය, පරිගණක මෘදුකාංග මිලදී ගැනීම, රසායනාගාර සඳහා ලී බඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම සහ පුහුණු හා ධාරිතා සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.69,500,000 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත්, 2016 ජූනි මාසය වන විටද එම කාර්යයන් සඳහා ප්‍රතිපාදන උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්
------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. |
| (ආ) | මෙහෙයුම් පාලනය | - | ආයතනයේ අරමුණු ඉටු කරගත හැකිවන පරිදි පර්යේෂණ කටයුතු සැලසුම්කර ක්‍රියාත්මක නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තොග පාලනය | - | සෙමින් චලනය වන තොග සහ නිශ්ක්‍රීය තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| (ඈ) | වාහන උපයෝජනය | - | වාහන පාලනය සහ වාහන අලුත්වැඩියා කිරීම් සම්බන්ධ සියලු කටයුතු එක් නිලධාරියෙකු විසින් සිදුකිරීම හේතුවෙන් නිසි අභ්‍යන්තර පරීක්ෂාවක් ක්‍රියාත්මක නොවීම. |